# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 සැප්තැම්බර් මස 07 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.09.13 දින නිකුත් කරන ලදී)


**ණය සහනදායක (සංශෝධන)**

**(81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමඟින් ණය සහනදායක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම හා ණය සහනදායක මණ්ඩලයේ සභාපතිවරයා හා අනෙකුත් සාමාජිකයන් තෝරා ගැනීමේ නිර්නායක ප්‍රතිශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමඟින් ශාඛා මණ්ඩල පිහිටුවීමේ බලතල අමාත්‍යවරයා වෙත පවරනු ලැබේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමඟින් ශාඛා මණ්ඩලයෙහි සභාපතිවරයා හා සාමාජිකයන් පත් කිරීමේ බලතල අමාත්‍යවරයා වෙත පැවරීම හා සාමාජිකයන් තෝරා ගැනීමේ සුදුසුකම් පිළිබඳ නිර්නායක ප්‍රතිශෝධනය කරනු ලැබේ.

එල්. ඩී.— ඕ. 72 /2017

**(81 වන අධිකාරය වූ ) ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක දරන ණය සහනදායක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 81 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු", යන වචන වෙනුවට "සාමාජිකයන් දසදෙනෙකුගෙන් සමන්විත විය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මණ්ඩලයේ සභාපතිවරයා—

(අ) මහාධිකරණ විනිසුරුවරයකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයකු ලෙස විනිශ්චයකාර ධුරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු ; හෝ

(ආ) නීතිඥවරයකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තකු,

විය යුතු ය.";

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් නවදෙනා—

(අ) නීතිඥවරයකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත; හෝ

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධුරයක තනතුරක් දරන හෝ දරා ඇති,

තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ "මණ්ඩලය විසින් කලින් කලට", යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් කලින් කලට", යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ශාඛා මණ්ඩලවල සංයුතිය.

8. (1) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා හතරදෙනකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විත විය යුතු ය.

(2) සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු අතර-

(අ) මහාධිකරණ විනිසුරුවරයකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයකු ලෙස විනිශ්චයකාර ධුරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු; හෝ

(ආ) නීතිඥවරයකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තකු,

විය යුතු ය.

(3) සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන්—

(අ) නීතිඥවරයකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත; හෝ

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I වන ශ්‍රේණියේ ධුරයක තනතුරක් දරන හෝ දරා ඇති,

තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) ශාඛා මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු ඕනෑම අවස්ථාවකදී —

(අ) ශාඛා මණ්ඩලයේ සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය;

(ආ) හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) ධුරයෙන් ඉවත් කරන ලද තැනැත්තකු හැර ශාඛා මණ්ඩලයේ සාමාජිකයකු වීම අවසන් වන ලද යම් තැනැත්තකු ඒ සඳහා නැවත පත්කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.